## අන්තර්ජාලය

පරිගණක තාක්ෂණයේ උච්ච අවස්ථාවක් ලෙස සැලකෙන ඉන්ටර්නෙට් සංකල්පය 60 දශකයේ අග භාගයේ දී පමණ ඇමෙරිකා එක්සත් ජනපදයේ දී ප්‍රකාශයට පත් විය. එතැන් පටන් නොයෙකුත් පර්යේෂණයන්ට හා වර්ධනයන්ට භාජනය වෙමින් දිගු ගමන් මගක් ආ අන්තර්ජාලය ලොව පුරා ප්‍රචලිත වන්නට පටන් ගත්තේ 90 දශකයේ දී ය.

එලෙස නොයෙක් රටවල් ඔස්සේ ඇවිද යමින් සිටි අන්තර්ජාලය ලංකාවට ගොඩ බැස්සේ 90 දශකයේ මැද භාගයේ දී ය. එනම් 1995 වර්ෂයේ දී ය. මෙම ආගමනය සිදු වූයේ ඉන්ටර්නෙට් සේවා දයකයින් දෙදෙනෙක් හරහා යි. ලංකාව තුළ අන්තර්ජාල සේවාවන් සැපයීමට මෙලෙස මුලින් ම ඉදිරිපත් වූයේ "ටෙලිකොම්" හා "ලංකා ඉන්ටර්නෙට්" යන ආයතන දෙක යි.




පස් වසරකට පෙර ඉන්ටර්නෙට් ආරම්භ වූ මොහොත

# පස් වසරක් සපුරන කිරිකැටි යෝධයා

**සිරිලාලන විජේසිංහ**

අන්තර්ජාලය හඳුන්වා දීම, ජාල තාක්ෂණය මෙරට පරිගණක ශිල්පීන්, විශේෂඥයින් අතර ප්‍රචලිත කිරීම ආදිය මුල් කාලයේ සෙමින් සෙමින් සිදුවෙමින් පැවතිණ.

එකවර ම යෝධ පිම්මක් හා ඒ හා බැඳුණු නොසිතූ විරූ අන්දමේ විස්තාරණයක් ජාල කටයුතු සම්බන්ධයෙන් සිදු විය.

ඒ කෙසේ ද යත් ?

ලේක්හවුස් ආයතනය සැමවිට ම පුරෝගාමී ආයතනයකි. මුද්‍රණ තාක්ෂණය සම්බන්ධයෙන්, සියළු කල්හි ම, සැමට ඉදිරියෙන් සිටි ලේක්හවුස් ආයතනය ජාල තාක්ෂණයේ දී ද පෙරමුණ ගත්තේ ය. එය යෝධ පිම්මක් විය. ලේක්හවුසිය පැත්තෙන් බැලූ කල එය තම ගමන් මගේ නව එක් පියවරක් වුව ද, ලංකාවේ පරිගණක ක්ෂේත්‍රය තුළ ජාල කටයුතු සම්බන්ධයෙන් එය සැබැවින්ම ප්‍රබල පියවරක් විය. ලේක්හවුස් ආයතනය අන්තර්ජාලයට එක්වූ තැන පටන් ලංකාව තුළ සිදුවූ ජාල කටයුතු ප්‍රසාරණය සුළුපටු නොවේ.

එයට ප්‍රධාන වශයෙන් ම බලපෑවේ ලේක්හවුසියේ මාධ්‍ය හා ප්‍රචාරක ශක්තිය යි.

අද අපි ආපසු හැරී බලන විට ඉතිහාසය ඉතා රසවත් ය. ලේක්හවුසිය මුලින් ම ලංකා ඉන්ටර්නෙට් ආයතනය සමග 1995 වසරේ දී ගිවිසුමකට එළැඹුනේ ය. එකල ඉන්ටර්නෙට් ප්‍රචලිත කිරීමට වඩාත් උනන්දුවෙන් කටයුතු කළේ (BOI ආයෝජන ප්‍රවර්ධන කලාපීය තත්ත්වය ලැබූ සමාගමක් වන) ලංකා ඉන්ටර්නෙට් සමාගම යි. අපි ඔවුන් සමග එලෙස ගිවිසුමකට එළඹුණු මුල් ම පුවත්පත් සමාගම යි.

ජාල කටයුතු සම්බන්ධයෙන් සිදු කළ ශක්‍යතා අධ්‍යයනයකට, (Feasibility Study) එකකට, පසුව ලේක්හවුස් ආයතනය තම දිනපතා ඉංග්‍රීසි පුවත්පත වන Daily News සහ සතිපතා ඉංග්‍රීසි පුවත්පත වන Sunday Observer අන්තර්ජාලයට එක් කරන්නට තීරණය කළා ය.

මුද්‍රිත පුවත්පත් වූ මේවා අන්තර්ජාලයට එක් කරන විට විද්‍යුත් පුවත්පත් ලෙසින් සැකසිය යුතු විය. එමෙන් ම පුවත්පත එහෙම පිටින් ම ජාලයට එකතු කිරීම ද කළ නොහැකි විය.

තෝරා ගත් පුවත්, එනම් අන්තර්ජාතික වශයෙන් උනන්දුවක් දක්වෙතැයි සැලකෙන පුවත් පමණක් පළකිරීමට ද පුවත්පතෙහි වෙළෙඳ දැන්වීම් අතරින්, දැන්වීම්කරුවන් ඉන්ටර්නෙට් හි පළ කිරීමට කැමැති වූ දැන්වීම් පමණක් තෝරා ගැනීමට ද තීරණය විය. එහෙත් මුල් කාලයේ වෙළෙඳ දැන්වීම් නොතිබිණි.


අදල විද්‍යුත් පුවත්පත සැකසීමේදී HTML Hyper Text Mark-up Language නම් පරිගණක භාෂාවක් භාවිත කරන ලද අතර "හොට් ඩෝග්" Hotdog නම්වූ පිටු සැකසීමේ මෘදුකාංගයක් Editing Software එනම් පිටු සකසන මෙවලමක් භාවිත කෙරිණ.

මෙලෙස Daily News, Sunday Observer පුවත්පත් දෙකෙහි අන්තර්ජාල ප්‍රකාශනයන් Internet Editions එළිදක්වන්නට අදල සියලුම කටයුතු සම්පාදනය කෙරිණ.

මෙහිදී භාවිත වුණු තාක්ෂණය අතිශයින් නව්‍ය වූ අතර තෝරා ගත් පිරිසකට, කෙටිකාලීන දැඩි පුහුණුවක් Intensive Training සති දෙකක දී ලබාදෙන ලදී.

ඉන්පසුව එළැඹුණු සුභ මොහොතකින් 1995 සැප්තැම්බර් මස 04 වෙනි දින, **ලංකාභූමිය මත සිට ගොණු කරන ලද ප්‍රථම ලාංකීය විද්‍යුත් පුවත්පත** ඉන්ටර්නෙට් ජාලයට එක් විය.

(දෙමළ ඊළාම්වාදීන් 1990 පමණ අන්තර්ජාලයට ඇතුළු වී සිටි අතර ඊළාම් පුවත්පත් ඇමරිකාවේ සහ කැනඩාවේ සිට ඒ කාලයේ පටන් ම ජාලගත කෙරිණ.




(19 වැනි පිටුවට)

# පස් වසරක්...

(02 වැනි පිටුවෙන්)

මේ ඒලාම්වාදී ප්‍රචාරණවල අසත්‍යභාව හා ඒක පාක්ෂික පක්ෂග්‍රාහී බව ලොවට හඬ ගා කියන්නට මුල්වරට හැකි වූයේ මෙලෙස ලේක්හවුස් පුවත්පත්, ජාලයට එක්වූ තැන් පටන් ය.)

මෙය අප මාධ්‍ය ඉතිහාසයේ සුවිශේෂී පියවරක් විය. මේ පියවරට දායක වූවන් බොහොමයක් වන අතර ඒ අවස්ථාවේ ලේක්හවුස් සභාපතිත්වය දැරූ ලක්ෂ්මන් ජයවර්ධන මහතා මේ සඳහා පුරෝගාමී කාර්යභාරයක් ඉටු කළේ ය.

දියත් කරන ලද මාධ්‍ය ප්‍රචාරය නිසා "ඉන්ටර්නෙට්" යන නම, ඊට අදාළ විස්තර තොරතුරු සහ තාක්ෂණය බොහෝ දෙනා අතරට ගලා ගියේ ය. ශිෂ්‍යයන්, තාක්ෂණවේදීන්, විද්වතුන් පමණක් නොව සාමාන්‍ය ජනතාව ද ඉන්ටර්නෙට් ගැන විමසන්නට පටන් ගත්හ.

මෙයට මූලික ම හා වැදගත් ම හේතුව වූයේ ලේක්හවුසියේ ප්‍රචාරක ශක්තිය යි. ඉන්ටර්නෙට් ගැන කරන විමසුම් මුල් අවධියේ දී ආයතනයට කොතෙක් ගලා ආවේ ද යත් ඒවාට පිළිතුරු දීම වෙනම ම රාජකාරියක් බවට පත් විය. ඒ සම්බන්ධයෙන් දෙන ලද පිළිතුර කොතරම් වාර ගණනක් පුනරුච්චාරණය කෙරුණේ ද යත් එය මුල සිට අගට අපට කටපාඩම් විය. එකල ඉන්ටර්නෙට් ප්‍රකාශන අංශයේ කාගේත් මුවග රැඳුණු විහිළුවක් වූයේ අප ඉන්ටර්නෙට් යනු කුමක්ද, යි හීනෙනුත් උගන්වන බව යි.

මෙලෙස ඉන්ටර්නෙට් ගැන බොහෝ දෙනා දැනුවත් වීම ද බොහෝ ආයතන ඉන්ටර්නෙට් වෙබ් අඩවි ඇති කිරීම ද නව නවත් ඉන්ටර්නෙට් සේවාදායක ආයතන බිහිවීම ද පසුගිය පස් වසර මුළුල්ලෙහි ලංකාව පුරා ශීඝ්‍රයෙන් සිදු විය.

අද වන විට විජය, ලීඩර් හා උපාලි යන පුවත්පත් ආයතන ද විශ්ව විද්‍යාල රාජ්‍ය හා පෞද්ගලික ආයතන අති විශාල සංඛ්‍යාවක් ද අන්තර්ජාලය හා සම්බන්ධ වී ඇත.

මූලික කඩඉම් පසු කර ජාලය වෙත ඇතුළු වුව ද ජාලය තුළ තරගකාරීව රැඳීම නම් එතරම් පහසු කටයුත්තක් නොවේ.

පුවත්පත් ආයතනයක "ජාල වෙබ් අඩවිය", web site එක, ජීවමානව පවත්වා ගැනීමට නම් මාධ්‍යවේදීන් ද, වෙබ් තාක්ෂණ ශිල්පීන් ද කරට කර ගැටෙමින් තම දස්කම් විදහා පෑ යුතු වෙයි.

වෙබ් අඩවියට නිරතුරුව ම නව තොරතුරු Hot news එක් කළ යුතු ය. පුවතක් ලද විගස එය සකසා හැකි ඉක්මනින් ජාලගත කිරීමට Update කිරීමට, මාධ්‍ය කරුවා කොපමණ දක්ෂ ද ඒ පමණට ම වෙබ් අඩවිය ජීවමාන වේ. මුද්‍රිත පුවත්පතක යම් පමණකට හෝ වැල්වටාරම් ලිවිය හැකි වුවද ජාල පුවත්පතක දී මෙය කිසිසේත් කළ නොහැක.

පුවත්පත් පිටුවක් පරිගණක තිරය මතට කැඳවාගෙන ඊමට ගතවන කාලය යනු මුදල් ය. (Time is the cost) ඒ නිසා පුවතක සාර සංක්ෂේපය පමණි ජාල ප්‍රකාශනයක අඩංගු විය යුත්තේ.

ජාල තාක්ෂණය අතින් ද කරුණු ගණනාවක් සැපිරිය යුතු ය. වෙබ් පිටු ව්‍යූහය Web Structure සරල විය යුතු ය. පිටු අතර බැඳීම් Links නිවැරදි විය යුතු ය. පිටුවෙන් පිටුවට පහසුවෙන් යා හැකි විය යුතු ය. Links must be workable. පිටුවක ඡායාරූප හා චිත්‍ර අඩුවෙන් භාවිත කළ යුතු ය. Less graphics. පිටුවක් පහසුවෙන් පරිගණක තිරය මතට කැඳවිය හැකි විය යුතු ය. Quick down-loadability. මෙවන් තාක්ෂණික ශිල්පෝපක්‍රම ගණනාවක් මනාව භාවිත කළ හොත් පමණි වෙබ් අඩවිය සාර්ථක එකක් බවට පත් කළ හැක්කේ.

ඒ අතින් ලේක්හවුස් වෙබ් අඩවිය ඉහළ තත්ත්ව ගුණයකට හිමිකම් කියයි. ජාල පුවත්පත් සම්බන්ධයෙන් පර්යේෂණ කරන ස්වාධීන විශ්ව ආයතනයක මෑත ගවේෂණ වාර්තාවකට, (Survey report) අනුව ලේක්හවුස් වෙබ් අඩවිය ලෝකයේ ජීවමාන ම වෙබ් අඩවි අතරින් පළමු 5% අතරට ඇතුළු වී සිටී. මෙය අප පියමං කළ පස් වසරක ගමන් මගේ අභිමානවත් සනිටුහනකි. එය ද අතැතිව අපි නව සහස්‍රකය කරා පෙරමග බලමු.

❑